## අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**මෙම අධිකාරියේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා අදාල සුදුසුකම් සපුරන, කුසලතා පූර්ණ, කාර්යශූර, විශිෂ්ට චරිතයකින් හෙබි ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| අංක | තනතුරු නාමය | සේවා ගණය, වැටුප හා වයස් සීමාව | සපුරාලිය යුතු සුදුසුකම් | පුරප්පාඩු පවතින ස්ථාන |
|---|---|---|---|---|
| 01 | සැළසුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) | **<u>සේවා ගණය</u>**<br>කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2)<br><br>**<u>මාසික දීමනාව</u>**<br>රු.43,379.00 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><br>**<u>වයස් සීමාව</u>**<br>අවුරුදු 18 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි | **01.** එක් එක් තනතුරෙහි කාර්‍ය භාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br><br><u>තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්.</u><br><br>අදාළ ක්ෂේත්‍රයේ එක් වසරක (01) සේවා පලපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. | ප්‍රධාන කාර්යාලය |

**සැ.යු:**

- ඉහත තනතුර සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර කාර අරමුදලට හිමිකම් සහිතය.
- අදාළ අයදුම් පත්‍රය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වෙබ් පිටුවෙන් www.vtasl.gov.lk භාගත කරගත යුතුය.
- රජයේ/රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවයේ නියුතුවූවන් සඳහා ඉහත වයස් සීමාවන් අදාළ නොවේ.
- අදාළ අයදුම්පත් **2026 මාතර්‍තු මස 27 දින** හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කල යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ **<u>සැළසුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම)</u>** යන්න_සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ, අදාල සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විවෘත ලිඛිත තරඟ විභාගයකින් හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ. බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපති/ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති/ප්‍රධාන විධායක නිළධාරී,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
"නිපුණතා පියස", 04 වැනි මහල, අංක 354/2, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දු.ක.අංක - 0112-596516/17

*- ජීවිතයට හැකියාවක් හැකියාවට රැකියාවක් -*